
ට්වින්ක්ලින්කා
ජානකී සූරියආරච්චි
විකිරි කතන්දර
146

l;dj Ñ;%

mß.Kl wlaIr iy j¾K ixfhdackh

# ජානකී සූරියආරච්චි


## ටිකිරි ප්‍රකාශකයෝ

1490/8, **හෝකන්දර පාර**, **පන්නිපිටිය**. Tel: 2847438,
E-mail: janu@tikiri.com, Web: www.tikiri.com



ප්‍රථම මුද්‍රණය - 2008

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-
**Book Ref: T/08/146**

මුද්‍රණය
තරංජී ප්‍රින්ටර්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තුතිය !**

මගේ පොත්වල අඩු පාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක්වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩු පාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
20-09-2008

# ටිවින්ක්ලින්කා

සෙල්ලම් බඩු සාප්පුවට අලුතින්ම ගෙනා බෝනික්කි ටිවින්ක්ලින්කා.
එයාව සාප්පුවට අරගෙන එනකොට සාප්පුවෙ අය සතුටින් කෑගැහුවා.
"අනේ හරිම ලස්සන බෝනික්කියක්. සුරංගනාවියක් වගේ."
"ඇත්තටම මේ තරම් ලස්සන බෝනික්කෙක් මම කවදාවත් දැකලා නෑ.
මේ බලන්නකො ඇඳුම්වල ලස්සන, දියමන්ති වගේ දිලිසෙනවා."
හැමෝම වට වෙලා බෝනික්කිගෙ හැඩ බැලුවා.

"මොකක්ද මේ දාලා තියෙන නම එයාට...ටිවින්...ක්ලින්...කා!"
"අමුතු නමක්, කියනකොට දිවත් හැපෙනවා. අපි එයාට ටිවින්කි කියමු"
"ඒක හොඳයි. බෝනික්කි වගේම නමත් ලස්සනයි."
"ලස්සන පුංචි කුමාරියක් නම් දැක්ක හැටියෙ අරගෙන යයි."
සාප්පුවේ අක්කලා ටිවින්ක්ලින්කා වඩාගෙන ගිහින්,
සාප්පුවෙ තිබුණු හොඳම රාක්කයේ උඩම තට්ටුවෙන් තිබ්බා.





ඒත් ඒ කවුරුවත් දැනගෙන හිටියෙ නෑ එක දෙයක්. ඒ තමයි, මේ සෙල්ලම් බඩු කම්හලේ හදන සෙල්ලම් බඩුවලට හොඳින් ඇහෙන බවයි, කතා කරන්න පුළුවන් බවයි. ඉතින් ට්වින්ක්ලින්කාටත් සාප්පුවෙ අය කතා කළ හැම දෙයක්ම හොඳින් ඇහුණු බව, එයාලා දැනගෙන හිටියෙ නෑ.



"ආ? මම ඒ තරම්ම ලස්සනයිද?"
ට්වින්කිට හිතාගන්න බෑ.
මේ ඇත්තමද කියලා හරියටම බලාගන්නකල්
ට්වින්කිට ඉවසිල්ලක් නෑ. සුරංගනාවියක් වගේ
ලස්සනයි කිව්වම කාටද ආස නැත්තෙ.
ඉතින් ට්වින්කි හොරෙන් වට පිට බැලුවා,
කවුරුවත් බලාගෙන ඉන්නවද කියලා.
ඊට පස්සෙ ඇඟිලිවලින් ඉස්සිලා එබිලා බැලුවා,
ඉස්සරහ බිත්තියේ තිබුණු ලොකු කන්නාඩියට.
කන්නාඩියෙන් පෙනුණු ලස්සන දැකලා
ට්වින්කිට ඇස් අදහාගන්න බැරි වුණා.

"හ්....ඇත්තටම මේ මමද?"
ට්වින්කි ඇසි පිය ගහලා ආයෙමත් කන්නාඩියට එබිලා බැලුවා.
"මේ තරම් ලස්සන රෝස කම්මුල් ! මේ තරම් ලස්සන නිල් ඇස් !
මේ තරම් ලස්සන රන්වන් කොණ්ඩයක් ! මේ තරම් ලස්සන දිලිසෙන ඇඳුම්!"
පුංචි බෝනික්කිට සතුට ඉවසගන්න බෑ.
"ම්...එයාලා කිව්වෙ "ලස්සන පුංචි කුමාරියක්" ඇවිත්
මාව අරගෙන යාවි කියලයි.
ඒ කියන්නෙ ගොඩාක් ලස්සන කෙනෙක්ද දන්නෙ නෑ."
ට්වින්කි කල්පනා කළා.
පුංචි කුමාරියක් කීවෙ කාටද කියලා නම්
පුංචි බෝනික්කිට හරි හැටි තේරුණේ නෑ.
ඒ කියන්නෙ පින්තූර පොත්වල
ඉන්නවා වගේ, ලස්සනම ලස්සන
පුංචි ගෑනු ළමයෙක් වෙන්න ඇති
කියලා එයා හිතාගත්තා.





පුංචි බෝනික්කි ඇස් දෙක පියාගෙන හීන බැලුවා.

"....ලස්සන...නිල් ඇස් තියෙන...ලස්සන රෝස කම්මුල් තියෙන...ලස්සන රන්වන් කොණ්ඩයක් තියෙන...පුංචි කුමාරියක්...දවසක එයාගෙ අම්මා එක්ක එයි අපේ සාප්පුවට...මාව පෙන්නලා අම්මට කියාවි, අනේ අම්මා මට මේ ලස්සන බෝනික්කා අරගෙන දෙනවද කියලා...එතකොට අම්ම කියාවි, හා මගෙ චූටි දූ කියලා. එතකොට පුංචි කුමාරි මාව ආදරෙන් වඩා ගනීවි. සිංදු කියල මාව නළවාවි. සුරංගනාවියො ගැන, මල් කුමාරියො ගැන ලස්සන ලස්සන කතන්දර කියා දේවි. මුළු දවසම මා එක්ක සෙල්ලම් කරාවි. පුංචි කුමාරිගෙ යාළුවො කියාවි, ඔයාගෙ බෝනික්කි හරිම ලස්සනයි කියල. එතකොට පුංචි කුමාරිට ගොඩක් සතුටු හිතේවි."
හීන ලෝකෙක අතරමං වුණා, පුංචි බෝනික්කි.


ටිකෙන් ටික හැන්දෑ වුණා. කළුවර වැටුණාම සෙල්ලම් බඩු කඩේ අක්කලා කඩේ වහලා යන්න ගියා. කඩේ වැහුව හැටියෙම රාක්කවල හිටි වලස් පුංචො, හා පැංචො, බෝනික්කො, ඔක්කොම කෑගහගෙන රාක්කවලින් බිමට පැන්නා. රෑ කාලෙ තමයි පුංචි සෙල්ලම් පැංචන්ගෙ සතුටුම කාලෙ. ඒත් අද නම් ඒ හැමෝටම විශේෂ දවසක්. ඇයි, සෙල්ලම් බඩු කඩේට අලුතින් ලස්සනම ලස්සන පුංචි බෝනික්කියක් ඇවිත්. සෙල්ලම් පැංචො ටික කෑගහගෙන දුවලා ඇවිත් පුංචි ට්වින්කි වට කරගත්තා. ට්වින්කිට චුට්ටක් බයත් හිතුණා. බයක්ම නෙමෙයි... චුට්ටක්... ... මොකද්ද වගේ. ඒත් හරි සතුටුයි. පුංචි ට්වින්කිට පුංචි යාළුවෝ ගොඩයිනෙ.


“ඔයා නම් හරී...ම ලස්සනයි. මොකද්ද ඔයාගෙ නම?”

“ඔයාගෙ ඇස් නිල් පාට මැණික් කැට වගේ.”

“ඔයාගෙ ගවුමෙ, කොණ්ඩෙ, දිලිසෙන්නෙ ඇත්තටම තරු කැටද?”

ට්වින්කිට ප්‍රශ්න වැස්සක් වැස්සා. ළමා සාරියක් ඇඳගෙන හිටි මලිතියි, කිමෝනෝවක් ඇඳගෙන හිටි අට්සුකෝයි, ඇසි පිය ගහන්නත් අමතක වෙලා වගේ බලා හිටියා.





"ඔයා නම් සුරංගනා ලෝකෙන් ආව කෙනෙක් වගේ. ඔයාගෙ ගවුම වලාකුළක් වගේ." දුඹුරු ඇස් බෝනික්කි ලිලැක්, ඇස් දෙක ලොකු කරගෙන කීවා.
"ලස්සන පුංචි ගෑනු ළමයෙක් ඇවිත් ඔයාව ඉක්මනටම අරගෙන යයි."
නළලෙ රතු මොට්ටුවක් තියලා, කොණ්ඩෙ මල් ගහගෙන හිටි බ්‍රින්දා, ට්වින්කිගෙ කොණ්ඩෙ අතගාමින් කීවා.
"අනේ...ඒත් එයා ලස්සන පුංචි කුමාරියක් වගේ වෙන්න ඕනෙ." ට්වින්කි හිතින් මුමුණා ගත්තා. ඒ අතරෙ එක වලස් පුංචෙක් දුවලා දුවලා ඇවිත්, එකපාරටම ට්වින්කිව වඩාගත්තා, පුළුන් කොට්ටයක් වගේ. කට්ටිය හැමෝම අත්පුඩි ගහමින් හිනා වුණා. පුංචි ට්වින්කිට ලැජ්ජාත් හිතුණා. හරිම යාළුවෝ ටිකක් තමයි!
සෙල්ලම් බඩු සාප්පුවෙ හිටි සෙල්ලම් පැංචො ටික, ඇත්තටම හරි අපූරුයි කියලා ට්වින්කිට හිතුණා. දෙමලිච්චො රෑනක් "කිචි බිචි-කිචි බිචි" ගානවා වගේ, සද්දෙ ! බූල් වලස් පැංචො, කිරි සුදු හා පැංචො, එක එක රටවල බෝනික්කො, මේ හැමෝම හිටියෙ හරිම සතුටින්. කෑ ගහමින් දුව පනිමින් සෙල්ලම් කරන සෙල්ලම් පැංචො ටික දැක්කාම, ට්වින්කිට හරි ආස හිතුණා. එයාලා හැමෝම ට්වින්කිගෙ ලස්සන බලන්න පොරේ. එක එක්කෙනා ට්වින්කිගෙ ලස්සන ගැන කියනකොට එයා ලැජ්ජාවෙන් ඇඹරුණා. මූණ රතු වුණා. හිතේ සතුට දරාගන්න බැරි තරම්. සතුට වැඩිකමට හුස්මත් හිර වුණාද මන්දා. ලැජ්ජයි, සතුටුයි.
අලුත් යාළුවන්ට මොනවා කියන්නද කියලා ට්වින්කිට හිතාගන්න බැරි වුණා.
අද ඉතින් මුල්ම දවසනේ...චුට්ටක්...චුට්ටක් ලැජ්ජයි.



සෙල්ලම් පැංචො ටික ට්වින්කිව ඇදගෙන ගියා සෙල්ලම් කරන්න. යාළුවො ටික රෑ එළි වෙනකල්, හති වැටෙනකල්, සෙල්ලම් කළා. කොහොම හරි පහුවදා උදේ එළි වෙනකොට, සෙල්ලම් පැංචො ටික ඔක්කොම රාක්කවල සීරුවෙන්. හරියට සිල් අරගෙන වගේ. රෑට ආවා නම් බලාගන්න තිබුණා සිල් ඇත්තන්ගෙ දඟ.

ඔන්න ඉතින් පහුවදා උදේ ඉස්සර වෙලාම ආවෙ ලස්සන පුංචි පැංචියක්, එයාගෙ අම්මා එක්ක. සාප්පුව ඇතුළට ආවා විතරයි, පුංචි පැංචි කෙළින්ම දුවලා ගියේ ට්වින්කි ළඟට.
"අනේ අම්මා, මේ බලන්නකො මේ බෝනික්කගෙ ලස්සන...අනේ මට මේ බෝනික්කා අරගෙන ඕනේ...මිහ්...මිහ්..." පුංචි බබා අම්මගෙ අතින් අදිමින් කෙඳිරිගෑවා.
"නෑ දූ, ඒ තරම් වටින බෝනික්කෙක් ගන්න මට සල්ලි නැහැනෙ. ඊට වඩා ගණන් අඩු එකක් ගන්නකො මගෙ හොඳ දූ වගේ." අම්මා එහෙම කියනකොට පුංචි පැංචිගෙ මූණ ඇඹුල් වුණා. කට උල් වුණා. "මිහ්...මිහ්..." කෙඳිරිවලට බෝනික්කා ලැබෙන පාටක් නම් නෑ වගේ. අන්තිමට අම්මා බලෙන්ම වගේ වෙන බෝනික්කෙක් අරගෙන දුන්නා. ඒත් ඒ බෝනික්කි ඉනේ ගහගෙන යන අතරෙත් පැංචිගෙ ඇස් දෙක තිබුණෙ ට්වින්කි ළඟ. "අනේ පව්!" ට්වින්කිට හරි දුකයි. ඒත් මොනවා කරන්නද?
ඒ ට්වින්කිගෙ පුංචි හීනෙ හිටි පුංචි කුමාරි නෙමෙයිනෙ.



ටික වෙලාවකට පස්සෙ, ඔන්න තව පැංචියො දෙන්නෙක් ආවා සාප්පුවට. බැලු බැල්මට දෙන්නම එක වගේ. දෙන්නම ලස්සනයි තමයි, ඒත් ටිවින්කිගෙ හීන කුමාරි තරම් නම් ලස්සන නෑ. ලස්සන කොහොම වුණත් දෙන්නගෙ ඇඳුම් දෙක නම් ඇළේ දාලා අපුල්ලන්න වෙනවා. ගවුම් පුරාම අයිස්ක්‍රීම් හලාගෙන. ඒකවත් හරියට කන්න දන්නෙ නැති පාටයි. ඒ මදිවට පැණි වලස් පුංචෙක් අල්ලාගෙන දෙන්න දෙපැත්තට අදිමින් රණ්ඩු වෙනවා. දෙන්නටම ඕනෙලු එකම වලස් පුංචා. මොනවා කරන්නද? අනේ පව්!  කව්ද? "පැණි වලස් පුංචා!"

රණ්ඩුකාරියො දෙන්නගෙ අම්මා ඔළුවෙ අත ගහගෙන බලාගෙන හිටියා, හොඳ පණ ගිහින් වගේ. පුදුමයක් යැ ! මේ වගේ රණ්ඩුකාරියො දෙන්නෙක් බලාගන්නවාට අම්මට දෙන්න ඕනෙ, තෑග්ගක්.

ගෑනු ළමයි දෙන්නා රණ්ඩු වුණු හැටි දැකලා ටිවින්කි හොඳටම බය වුණා. බැරි වෙලාවත් ඒ දෙන්න ටිවින්කිව අරගත්තොත්? අනේ අපොයි ! දෙන්න දෙපැත්තට ඇදලා අත පයත් කඩාගන්න තමයි වෙන්නෙ. ඒ නිසා ගෑණු ළමයි දෙන්නා රාක්කය පැත්තට එනකොට, ටිවින්කි ඉක්මනටම එයා ළඟ හිටි උස මහත වලස් පුංචාගෙ බූල් අත පිටිපස්සෙ මූණ හංගා ගත්තා. එයා තමයි රොබී. රොබීත් සතුටින් උදව් කළා, ටිවින්කිට හැංගෙන්න. අනේ අහිංසක පුංචි ටිවින්කිව මේ වගේ නපුරු ළමයි දෙන්නෙකුට නම් ගෙනියන්න දෙන්න බෑ, කියලා රොබීට හිතුණා. රණ්ඩුකාරියො දෙන්නා රණ්ඩු වෙවී රාක්කය ළඟින් ගියා. ඇති යාන්තම්, ටිවින්කිව දැක්කෙ නෑ.





ඊට ටික වෙලාවකට පස්සෙ තවත් පොඩිත්තියක් ආවා. මූණ නම් ලස්සනයි වගේ. අපොයි! හිනා වුණාමයි දැක්කෙ, දත් ටික ඔක්කොම දුඹුරු පාට වෙලා.
ඇත්ත නේන්නම්. මේ පොඩිත්ති ඒ වෙලාවෙත් හිටියෙ, දිය සායම් පෙට්ටියක් තරම් ලොකු චොකලට් පෙත්තක් හපමිනුයි. ඉතින් දත් ටික සුදු වෙයි යැ.

ඊ ළඟට, චොකලට් පෙත්ත එතනම බිම දාලා චොකලට් ගෑවුණු අත් දෙක බිත්තියේ පිහදැම්මා. ඊට පස්සෙ ගිහින්, දුඹුරු පාට අත්වලින් රාක්කයක තිබුණු වලස් පුංචො දෙන්නෙකුයි, බෝනික්කො තුන්දෙනෙකුයි උස්සාගත්තා. ඒත් ට්වින්කිව දැක්ක හැටියෙ, ඒ ඔක්කොම බිම අතෑරලා ට්වින්කි දිහාට දුවගෙන ආවා. ට්වින්කි හොඳටම බය වුණා. දැන් හැංගෙන්නත් වෙලාවක් නෑ. වට පිට බලන්නත් බෑ. එතකොටම එයාට හොඳ අදහසක් ආවා. ඒ පොඩිත්ති ළඟට එනකොටම ට්වින්කි ඉක්මනට ඇස් වපර කරගත්තා, හොල්මනක් වගේ.
"අපෝ, මේ බෝනික්කගෙ ඇස් වපරයිනෙ."
පොඩිත්ති මූණ ඇඹුල් කරගෙන ආපහු හැරුණා.
ට්වින්කි කළ වැඩේ දැකලා රොබීට තව චුට්ටෙන් හුස්මත් හිර වෙනවා, හිනා වෙලා.



මේ වගේ දවස්, සති පහු වෙලා ගියා. සෙල්ලම් බඩු සාප්පුවට ගොඩක් ගෑනු ළමයි ආවා. ගොඩක් බෝනික්කො අරගෙන ගියා. ඒත් ට්වින්කිගෙ පුංචි හීනෙ හිටි පුංචි කුමාරි නම් තවම ආවෙ නෑ. "හීන කුමාරි එනකල්ම ඉන්න එපා ට්වින්කියෝ. ඔයා තනිවෙයි." යාළුවො යනකොට ට්වින්කිට රහසින් කීවා. හ්ම්...! අනේ ඒත් වෙන කවුරු ආවත් ට්වින්කිට, යන්න නම් හිත දුන්නෙම නෑ. හීන කුමාරිම ඕනෙ කියලාමයි හිතුණෙ. ඉතින් වෙන ගෑනු ළමයි එනකොට ට්වින්කි රොබී පිටිපස්සෙ හැංගුණා. එහෙම නැත්නම් හුළඟට වැටිලා වගේ හිටියා. සාප්පුවේ අයටත් හිතාගන්න බැරි වුණා, මේ තරම් ලස්සන බෝනික්කියක් කවුරුවත් ගෙනියන්නෙ නැත්තෙ ඇයි කියලා. පුංචි ළමයි එනකොට ට්වින්කි හැංගෙනවා කියලා එයාලා දන්නෙ නැහැනෙ.

අනික් බෝනික්කො නම් බලාගෙන හිටියෙ, කවුරු හරි කමක් නෑ අයිතිකාරියක් එනකල්, ඉක්මනට. ඉතින් පුංචි බබෙක් එයාලාව ගත්තාම, එයාලා ගියේ හරි සතුටින්. පුංචි බබාලා එයාලාව වඩාගෙන යනකොට එයාලාට හරි ආඩම්බරයි. රාක්කවල ඉන්න අනික් යාළුවො බලාගෙන ඉන්නවද කියලා හොරෙනුත් බැලුවා. කොහොම හරි ටිකෙන් ටික ට්වින්කිගෙ පරණ යාළුවෝ හැමෝම වගේ පුංචි බබාලා ඇවිත් අරගෙන ගියා. ඒත් ට්වින්කිගෙ හීන කුමාරි නම් ආවෙ නෑ. ට්වින්කිගෙ හිතට පුංචි දුකක් දැනුණා නම් තමයි. ඒත් නපුරු හිතක් නම් ආවෙ නෑ කවදාවත්. ට්වින්කි ඒ යාළුවෝ හැමෝටම සුබ පැතුවා, ඇත්තටම.





ඒ වුණාට ට්වින්කිගෙ හොඳම යාළුවා රොබී ගිය දවසෙ නම් ට්වින්කිට කියාගන්න බැරි තරම් මහා දුකක් දැනුණා. රොබී...දුකට සැපට දෙකටම හැමදාමත් ළඟ හිටි හොඳම යාළුවා... කවදාවත් විහිළුවකින්වත් ට්වින්කිගෙ හිත රිදෙව්වෙ නෑ. ඒ තරමටම ට්වින්කිට ආදරෙයි.

"දුක් වෙන්න එපා ට්වින්කියෝ. ඔයාගෙ හීන කුමාරි ඉක්මනටම එයි."
රොබීව රාක්කයෙන් ගන්න කලින්, රොබී ට්වින්කිට හෙමින් කීවා.
රොබීටත් හරි දුකයි ට්වින්කි දාලා යන්න.
ඒත් මොනවා කරන්නද ? චූටි බබෙක් එයාව
අරගත්තාම යන්න එපායැ. එයාව අරගෙන යනකොට
රොබී කාටත් හොරෙන් අත වැනුවා, ට්වින්කිට.
ට්වින්කිත් අත වැනුවා, අමාරුවෙන් හිනා වෙමින්.
"මගේ හොඳ යාළුවට... කිසිම දුකක් නැතුව...
සතුටින් ඉන්න ලැබෙන්න ඕනෙ, හැමදා...ම."
ට්වින්කි හිතින් හිතුවා. ඒත් එතකොටයි දැනුණෙ
ට්වින්කිගෙ ඇස්වල කඳුළු.
"...මට හිටි හොඳම යාළුවා...රොබී...
අනේ මට පාළුයි රොබී..."
ට්වින්කිගෙ ඇස්වලින් කඳුළු කැට
කඩාගෙන වැටුණා. ට්වින්කි තනි වුණා.





තවත් සති, මාස ගතවුණා. ඒත් ට්වින්කිගෙ හීන කුමාරි නම් ආවෙ නෑ. ඒ අතරෙ එයාගෙ රෝස පාට කම්මුල්වල පාට අඩු වුණා. ලස්සන සේද ගවුම, දුවිලි වැදිලා පරණ වෙලා ගියා. එක දවසක් මකුළුවෙක් දැලකුත් වියන්න හැදුවා, ට්වින්කිගෙ ගවුමෙ. අනේ පුංචි බෝනික්කි දවසින් දවස මළානික වෙලා ගියා. ඉස්සර තිබුණු ලස්සන දවසින් දවස අඩු වුණා. අන්තිමේදි, කොයි තරම් මලානික වුණාද කිව්වොත් ට්වින්කි දිහා කවුරුවත් බැලුවේවත් නෑ.

අලුත් බෝනික්කො දවසින් දවස සාප්පුවට ගෙනාවා. එයාලාව තියන්න ඉඩ කඩ ඕනෙ නිසා ට්වින්කිව ටිකෙන් ටික රාක්කයෙ පස්සට තල්ලු වුණා. අලුත් බෝනික්කියො හරිම ලස්සනයි. ඒ වගේම හරි සුවඳයි. අලුත් අලුත් මෝස්තරවල. ට්වින්කි එයාලාට ඉඩ දීලා රාක්කෙ මුල්ලකට වෙලා බලාගෙන හිටියා. අලුත් බෝනික්කියො කොයි තරම් ලස්සන වුණත්, පුංචි ට්වින්කිගෙ හිතට නිකමටවත් තරහක් නම් දැනුණේ නෑ. එයාගෙ හිත පිරිලා තිබුණෙ දුකෙන්, පාළුවෙන්, තනිකමෙන්. අලුත් බෝනික්කියො ට්වින්කිගෙ අතින් ඇද්දා, සෙල්ලම් කරන්න.
ඒත් ට්වින්කිට සෙල්ලමක් කරන්න තරම්වත් හිත නෑ.
ට්වින්කිගෙ හිතත් මැළවිලා ගිහින් වගේ.



"අනේ මගේ පුංචි හීන කුමාරි එන්නෙ කවදද?" ටිවින්කි ඇස් දෙක කකියනකල් දොර දිහා බලාගෙන හිටියා, හීන කුමාරි අද එයි, හෙට එයි කියලා. දවස්, සති, මාස ගතවුණා. අහිංසක පුංචි බෝනික්කි තව තවත් මැළවුණා. ඒත් පුංචි බෝනික්කිගෙ පුංචි හීනෙ හිටි, හීන කුමාරි නම් ආවෙ නෑ.

ඔහොම ටික දවසක් යනකොට ටිවින්කිව මාරු කළා, පරණ රාක්කයකට. එදා නම් ගොඩාක් දුක හිතුණා, පුංචි බෝනික්කිට. දුක වැඩිකමට එයාට ඉකිගැහුණා. ඒත් එයා ඇඬුම් නවත්වගත්තා, අමාරුවෙන්. කඳුළුවලට මූණෙ තිබුණු ඉතිරි ලස්සනත් දියවෙලා ගියොත් කියලා, පුංචි බෝනික්කිට බය හිතුණා. එයා පරණ රාක්කයෙ මුල්ලකට වෙලා කල්පනා කරමින් හිටියා. තවත් දවස්, සති ගතවුණා. පාළුව තනිකම ඉවසගන්නම බැරි වුණා, පුංචි බෝනික්කිට. අන්තිමේදී ඕනෙම පුංචි බබෙක් එක්ක යන්න යනවා කියල ටිවින්කි හිතාගත්තා. ඒත් ඒ වෙනකොට ටිවින්කිගෙ ලස්සන අඩු වෙලා ගිහින්. පුංචි බබාලා ටිවින්කි දිහා බැලුවේවත් නෑ. හැමෝම ආවෙ, අලුත් ලස්සන බෝනික්කො ගන්න. හැමෝම වට කරගත්තෙ අලුත් බෝනික්කන්ව. ටිවින්කිව ගන්න කවුරුවත් අවෙ නෑ. ඇස්වලට ඉනූ කඳුළු එයා නවත්වගත්තෙ ගොඩක් අමාරුවෙන්.





ඔහොම ඉන්නකොට. එක දවසක් සෙල්ලම් බඩු සාප්පුවෙ ඉස්සරහ දොරෙන් ලස්සනම ලස්සන පුංචි ගෑනු ළමයෙක් ඇතුල් වුණා. මූණ මැළවිලා, කඳුළු පුරෝගෙන, ඈත බලා හිටි පුංචි බෝනික්කිගෙ ඇස් උඩ ගියා. කට ඇරුණා. “හ්........ඒ නිල් ඇස් දෙකමයි...ඒ රෝස කම්මුල්මයි...ඒ රන්වන් කොණ්ඩෙමයි... හරියටම ඒ වගේමයි...ඒ වගේ...මයි” පුංචි බෝනික්කිට ඉහළට ගත් හුස්ම පහළට දාන්නත් අමතක වුණා.

ඒ ලස්සන ගෑනු ළමයා හරියටම
ටිවින්කිගෙ හීනෙ හිටි පුංචි හීන කුමාරි වගේමයි...
"හරිම ලස්සනයි...ලස්සනම ලස්සනයි...
එයා නම් ඇත්තටම හීන කුමාරියක්මයි..."
ටිවින්කිට සතුට ඉවසගන්න බැරි තරම්.
ටිවින්කි ඉක්මනට ඇඟිලි තුඩුවලින් ඉස්සිලා,
පුළුවන් තරම් ඈතට බෙල්ල දික් කළා.
"බැරි වෙලාවත් හීන කුමාරි මාව නොදැක ගියොත්?"
ටිවින්කිට බයත් හිතුණා.



හීන කුමාරි හෙමින් හෙමින් රාක්ක දිහා බල බලා ආවා.
"එයා මට කැමති නොවුණොත්!" හීන කුමාරිගෙ අඩි සද්දෙට පුංචි ටිවින්කිගෙ පපුව ගැහුණා. හීන කුමාරි ටිවින්කිගෙ රාක්කය ළඟට ඇවිත් නැවතුණා.
ටිවින්කිගෙ හුස්මත් නැවතුණා, බයට.
ලස්සන හීන කුමාරි ටිවින්කිගෙ රාක්කය දිහාට අත දික් කළා.
"මට ඕනෙ මේ බෝනික්කො!" හීන කුමාරි කීවා.
...බෝනික්...කො?? ටිවින්කි හිතුවෙ ටිවින්කිව විතරක් ගනීවි කියලයි.

"මම බෝනික්කො ඉස්කෝලයක් දාලා ටීච වෙන්නයි යන්නෙ."
ලස්සන පුංචි කුමාරි එයාව එක්කගෙන ආව කෙනාට කීවා.
"හ්ම්... කමක් නෑ. මොනවා නැතත් මගේ පුංචි හීන කුමාරි මට හම්බ වුණානෙ."
ටිවින්කි සතුටින් හිතුවා.



ඒත් ට්වින්කිගෙ හීනෙ ඒ හැටියටම හැබෑ වෙන හැඩක් නම්...පෙනුණෙ නෑ.
"මේ ඔක්කොම බෝනික්කො පෙට්ටියක දාලා කාර් එකේ ඩිකියට දාන්න."
හීන කුමාරි එක්ක ආව කෙනා සාප්පුවෙ අක්කලාට කීවා. ඒ සැනෙන්ම එයාලා ඉක්මනට බෝනික්කො ටික අරගෙන පෙට්ටියකට දාන්න පටන්ගත්තා.
ට්වින්කිට කිසිම දෙයක් හිතාගන්නත් කලින් එයාව පෙට්ටියට දැම්මා.
රොසෙටා, කෙයිකි, මොමොකො එක්ක
තව බෝනික්කො පස් දෙනෙකුත්
ඒ පෙට්ටියටම එබුවා.




"අනේ ඌයි..."
පුංචි ට්වින්කිගෙ පුංචි අත නැමිලා
කෑගැහුණා. ඇස් දෙකෙන් කඳුළු පැන්නා.
"අනේ මේ මොකද වෙන්න යන්නෙ ?"
ට්වින්කිට බයත් හිතුණා.

එයාගෙ පුංචි හීනෙ නම් මෙහෙම දෙයක්
තිබුණෙම නෑ. පුංචි හීන කුමාරි ට්වින්කිව උකුළෙ තියාගෙන නළවමින් යයි කියලනෙ හිතුවෙ. ඒත් දැන් ?

පෙට්ටියට ඔබලා වැහුවට පස්සෙ කොහේ යනවද, මොනවා වෙනවද කියලාවත් පෙනුණෙ නෑ. අන්තිමට පෙට්ටිය අරිනකොට ට්වින්කි හිටියෙ ලොකු කාමරයක. පෙට්ටියෙ හිටි බෝනික්කො ටික බිමට හැලුවෙ හරියට බෝංචි ඇට ගොඩක් බිමට හලනවා වගේ. බිම වැටුණු පාරට ට්වින්කිගෙ කකුලකුත් නැමුණා.





"අහ්! ඌයි!" ට්වින්කි කකුල අල්ලාගෙනම වට පිට බැලුවා.
ඒ කාමරය ලොකු වුණාට, පුංචි හීන කුමාරියකගෙ කාමරයක් වගේ නම් පෙනුණෙ නෑ. අත් නැති බෝනික්කො, ඔළු නැති වලස් පුංචො, කකුල් නැති හා පුංචො, වලිග නැති වඳුරු පුංචො, කාමරය පුරාම බිම විසිරිලා තිබුණා. හරියට, කුණාටුවකට අහුවුණු සත්තු වත්තක් වගේ. පුංචි කුමාරියකගෙ කාමරයක් කොයි තරම් ලස්සන වෙන්න ඕනෙද! ට්වින්කිගෙ හිතට ලොකු බයක් දැනුණා. එක පුටුවක් ළඟ අහිංසක පුංචි හා පැංචෙක් බිම වැටිලා හිටියා. එතකොටම පුංචි කුමාරි එතනට ආවා.
"මොකද බිමට පැන්නෙ, ආ? මම කිව්ව නේද පුටුවෙන් හෙලවෙන්නවත් එපා කියල." හීන කුමාරි පුංචි හා පැංචට හයියෙන් කෑගැහුවා.
හීන කුමාරි හා පැංචට කෑගහනකොට, ගැස්සුණේ පුංචි ට්වින්කි.
ට්වින්කිගෙ කකුල් දෙක සීතල වෙලා ගියා.
ඔය වුට්ටට ඔය තරම් හයියෙන් කෑගහන්න ඕනෙද?

"අම්මෝ, මූණ ලස්සන වුණාට එයා නම් හරිම සැරයි වගේ."
පුංචි කුමාරි අහක බලන අතරෙ, රොසෙටා ට්වින්කිගෙ කනට කරලා කිව්වා.
ට්වින්කිට හිතුණෙත් හරියටම ඒකමයි.

පහුවදා උදේ හීන කුමාරි නැගිට්ට හැටියෙම බෝනික්කො ඉස්කෝලෙ පටන්ගත්තා.
බෝනික්කො ටික පේළි දෙකකට වාඩිකළා.
"හෙලවෙන්නෙවත් නෑ, ඔක්කෝමල්ලා...තේරුණාද?" හීන කුමාරි අණ කළා.
බෝනික්කියක් චුට්ටක්වත් ඇල වුණොත්, කුමාරිට හොඳටම කේන්ති ගියා.
ඒ ඔක්කොමටත් වඩා, පුංචි කුමාරි තවම නිදි ඇඳුමින්.
මූණ සෝදලත් නෑ, දත් මැදලත් නෑ, ඔළුව පීරලත් නෑ.
පුංචි කුමාරියො ඔහොමද!
"මේ කුමාරි දන්නෙ නැද්ද, උදේ නැගිට්ට හැටියෙ දත් මැදල මූණ සෝදන්න ඕනෙ කියල." මොමොකො කට තද කරගෙන කීවා.
ට්වින්කි පුංචි කුමාරිට බයේ ඔළුවවත් වැනුවෙ නෑ.
කොච්චර බයවෙලාද කිව්වොත් ඇසි පිල්ලන් ගැහුවෙත් බයෙන් බයෙන්.





ටික දවසක් යනකොට, හීන කුමාරි හොඳ වෙයි කියලා බෝනික්කො හිතුවා. ඒත් හීන කුමාරි හැමදාමත් ගොඩක් සැරවුණා, පුංචි බෝනික්කන්ට. එයා කියන විධියට ඉන්න බැරි වුණොත්, හොඳටම බැන්නා. කියන විධියටම ඉන්න එක නම් ඇත්තටම බැරි නෑ. ඒත් එයාගෙ නපුරුකම් නම් බෝනික්කන්ට ඉවසගන්න බැරි වුණා. සමහර වෙලාවට එයා බෝනික්කන්ට පයිනුත් ගැහුවා. එහෙ මෙහෙ විසිකළා. කේන්ති යන යන සැරේට බෝනික්කන්ව කෙනිත්තුවා.
"ඇත්තටම, මේ මං මග බලාගෙන හිටි හීන කුමාරිද ... ඇත්තටම ... හීන කුමාරිද?"
පුංචි ට්වින්කිට සමහර වෙලාවට හිතාගන්න බැරි වුණා.
පුංචි බබෙක්ගෙ ආදරයක් නැතුව, පුංචි බෝනික්කියක් කොහොම ඉන්නද.

"මට නම් දැන් ඇති වෙලා. සෙල්ලම් බඩු සාප්පුවෙ රාක්කෙ මීට වඩා කොච්චර හොඳද, කොච්චර පාළු වුණත්."
පුංචි කුමාරි ළඟ පාතක නැති අතරෙ රොසෙටා කීවා.
වචනයෙන් නොකීවත් ට්වින්කිට හිතුණෙත් ඒ ටිකමයි.
"මට නම් හිතාගන්න බෑ, මේ තරම් ලස්සන පුංචි කුමාරියක් කොහොමද, මේ තරම් නපුරු වෙන්නෙ කියලා." කෙයිකි කීවෙ පුදුමයෙන්.
"මට නම් හිතෙන්නෙ එයාට කවුරුවත් හොඳ සිරිත් උගන්වලාම නෑ. ඉස්කෝලෙවත් යනවද මන්දා." මොමොකො කීවෙ තරහින්.
"එතකොට කෝ එයාගෙ අම්මා තාත්තා? මම නම් තවම දැක්කෙ නෑ. අම්ම තාත්ත ළඟ නැති නිසාද දන්නෙ නෑ මේ තරම් නපුරු." රොසෙටා කීවෙ කල්පනා කරමින්.
"ආ, එහෙම කියල පුළුවන්ද අනික් අයට නපුරුකම් කරන්න, රිද්දන්න?" මොමොකො කීවෙ හොඳටම කේන්ති ගිහින්.
ට්වින්කිට නම් බය වැඩි කමට කිසිම දෙයක් කියාගන්න බැරි වුණා.




එක දවසක් පුංචි හීන කුමාරි පයින් ගහලා, පුංචි ට්වින්කි ඇඳ යටට විසිවුණා. ඇඳ යට හරිම කළුවරයි. දූවිලි පිරිලා. අහිංසක ට්වින්කි රෑ එළිවෙනකල් ඇඬුවා. එක සීරුවට ඉකිගහමින් ඇඬුවා. ට්වින්කිට මතක් වුණා, හීන කුමාරි එනකල් එයා ඇස් රිදෙනකල් බලා හිටි හැටි. කතන්දර කියමින් නළවයි කියලා, හීන බලපු හැටි. ඒත් දැන් හීන කුමාරි පයින් ගහලා, පුංචි බෝනික්කි ඇඳ යට.
පහුවදා උදේ, රොසෙටා ඒ ගැන හොඳටම කේන්තියෙන් හිටියෙ.
"එහෙමද එයා බෝනික්කො නළවන්නෙ! පුංචි ගෑනු ළමයි උනාම බෝනික්කන්ට ආදරේ වෙන්න එපායැ."
"සමහර විට එයාට කවුරුවත් ආදරේ නැතුව ඇති. ඒ නිසා වෙන්න ඇති එයත් කාටවත් ආදරේ නැත්තෙ." මොමොකො කීවා.
"මේ වගේ නපුරු ළමයින්ට කවුද ආදරේ කරන්නෙ. මම නම් චුට්ටක්වත් ආදරේ නෑ එයාට." රොසෙටාගෙ මූණ කේන්තියෙන් රතු වෙලා.

කොහොම හරි පුංචි කුමාරි හොඳ ළමයෙක් වෙයි කියලා ට්වින්කි බලාගෙන හිටියා. අද... හෙට...අනිද්දා...ඒත් නෑ. පුංචි කුමාරි පුංචි කුමාරිම තමයි, හැමදාම. මූණ හා පැටියෙක් වගේ ලස්සන වුණාට, කේන්ති ගියාම කොටි පැටියෙක් වගේ.

එක දවසක් පුංචි කුමාරි පාඩම් මේසෙ උඩ වාඩිවෙලා, කෑම කකා හිටියා.
ඒ අතරෙ කෑමත් හලමින් සෙල්ලමකුත් කරමිනුයි හිටියෙ. කෑම පිඟානයි,
හොදි දීසියයි, වතුරයි මේ හැම එකක්ම තිබුණෙත් පාඩම් මේසෙ උඩමයි.
පාඩම් මේස උඩ කෑම හලනවද පුංචි ළමයි?
ඒත් මේ පුංචි කුමාරි එහෙම තමයි. එයා කළේ එයාට හිතුණු දේ.





මේසෙ ළඟ බිම බෝනික්කො ගොඩක් වැටිලා හිටියා.
උඩින්ම හිටියෙ ට්වින්කි.

ඔහොම ටිකක් වෙලා ඉන්නකොට කුමාරිගෙ අත වැදුණා, හොදි දීසියෙ.
දීසිය පෙරළිලා ගිහින් වැටුණා බිමට.
කොහෙද දන්නවද වැටුණෙ?
බිම වැටිලා හිටි ට්වින්කිගෙ ඇඟ උඩට.
රතු පාට හොදිවලින්
ට්වින්කිගෙ ඇඳුම නැවුණා.
ඇඳුම විතරක් නෙමෙයි,
මූණ, කොණ්ඩෙ, හැම තැනමත්
හොදි විසිවුණා.





පුංචි කුමාරි මේසෙන් බිමට බැහැලා ඇවිත් බැලුවා.
"ඊ--ක්කා--!" එයා ටිවින්කිගෙ රන්වන් පාට කොණ්ඩ ගස්වලින් උඩට ඉස්සුවා.
නහය රැළි කරලා බැලුවා. ළඟ තිබුණු කුණු කූඩෙට විසිකළා, හරියට කුණුවෙච්චි
මාළු කෑල්ලක් වගේ. කාවද? සෙල්ලම් බඩු සාප්පුවෙ හිටි ලස්සනම බෝනික්කා!

කුණු කූඩයේ දාරෙ ඔළුවත් වැදීගෙන,
පුංචි ටිවින්කි මුණින් අතට වැටුණා,
කුණු කූඩෙට.
"අහ්! ඌ---යි"
පුංචි බෝනික්කි වේදනාවෙන් ඇඹරුණා.
ඇත්තටම කිව්වොත්, ටිවින්කිට
වැඩියෙන්ම රිදුණෙ හිත.
කොච්චර ලස්සනට හිටි බෝනික්කියක්ද
මෙහෙම විසිකරලා දැම්මෙ කුණු කූඩෙකට?
ටිවින්කි ගල්ගැහුණු තරමට කෑගහන්න
වචනයක්වත් පිටවුණේ නෑ.



ඒ එක්කම ගෙදර වැඩ කරන කෙනෙක් ඇවිත්, කුණු කූඩෙ අරගෙන ගිහින්, කුස්සිය පිටිපස්සෙ තිබුණු ලොකු කුණු මල්ලට දැම්මා. ඊට පස්සෙ කුණු මල්ල කරේ තියාගෙන ගිහින් පාර කෙළවර තිබුණු මහ කුණු කන්දකට දැම්මා.

අනේ අපොයි මේ කොහෙද මේ ! ටිවින්කි බයෙන් බයෙන් වට පිට බැලුවා. ඒ වගේ තැනක් නම් එයා කවදාවත් දැකල තිබුණෙ නෑ. කුණු වෙච්ච පලතුරු, එළවළු, හිස් ටින් බෙලෙක්ක, ගඳගහන කුණු, ටිවින්කි වටේ පිරිලා තිබුණා.
"අනේ මට මේ මොකද වුණේ?" පුංචි බෝනික්කිට හිතාගන්නත් බැරි වුණා.
කොයි තරම් ලස්සනට හිටි බෝනික්කියක්ද.
සෙල්ලම් බඩු සාප්පුවෙ, හොඳම රාක්කෙ, උඩම තට්ටුවෙ හිටි පුංචි බෝනික්කි.
හැමෝම ආදරේ කළ සුරංගනාවි.
කුණු ගොඩේ !



කුණුවල ගඳ ඉවසන්නම බැරි තරම්. ට්වින්කි පුළුවන් තරම් නහය අකුලාගෙන හිටියා. කුණුවල ගඳ විතරක් නම් බැරියැ. පුංචි මීයො, කැරපොත්තො, බලු කුක්කොත් කුණු ගොඩේ එහා මෙහා ගියා. ට්වින්කිගෙ ඇඟ උඩිනුත් ගියා. මූණ උඩිනුත් ගියා. කැරපොත්තො කටෙත් යන්න හැදුවා. එක බලු කුක්කෙක් ට්වින්කිගෙ මූණ ළඟටම ඇවිත් ඉව කළා. අහිංසක පුංචි බෝනික්කි බය වුණු තරමට, යටි ගිරියෙන් කෑගැහුවා. ඒත් පුංචි බෝනික්කියකගෙ පුංචි හඬ කාට ඇහෙන්නද?



රෑ කළුවර වැටුණා. පුංචි බෝනික්කි කුණු ගොඩේ කුණුවලින් වට වෙලා, ඔහේ බලාගෙන හිටියා, අහස දිහා. ඒ වගේ දුක්බර දවසක් ටිවින්කිට කවදාවත්ම තිබුණෙ නෑ. ඔක්කෝටම වඩා, හිතට දැනුණු දුක වාවගන්න බැරි වුණා.
කාට මොන වරදක් කළ බෝනික්කියක්ද?

ටිවින්කිට හැම දෙයක්ම මතක් වුණා, එකින් එක. ලස්සන දිලිසෙන පෙට්ටියක බැහැලා සෙල්ලම් බඩු සාප්පුවට ආ හැටි. සෙල්ලම් බඩු සාප්පුවෙ අක්කලා එයාව දැකලා සතුටින් කෑගහපු හැටි. එයා කන්නාඩියට එබිලා හොරෙන් මූණ බලපු හැටි. කොයි තරම් ලස්සන කාලයක්ද ඒ.



ර්ටත් වඩා, එයා වට කරගෙන විහිළු කළ සෙල්ලම් පැංචො ටික.
රෑ එළිවෙනකල් සෙල්ලම් කළ හැටි. ඉක්කා වැටෙනකල් හිනා වුණු හැටි.
ඔක්කෝටම වඩා ටිවින්කිගෙ හොඳම යාළුවා රොබී.
රොබී...අනේ රොබී...ටිවින්කිගෙ ඇස්වලින් කඳුළු හැලුණා. හැලුණා නෙමෙයි ගැලුවා, ගඟක් වගේ. ඒ තරම් හොඳ යාළුවෙක් කොහෙන් හොයන්නද?
"අනේ රොබී කොහේ ඇද්ද දැන්. එයා දන්නවා නම් මට වුණු දේ." ටිවින්කිට මතක් වුණා එයාගෙ හීන කුමාරි ගැන කියලා රොබී විහිළු කළ හැටි. පුංචි බබාලාට නොපෙනෙන්න ටිවින්කිව පරිස්සම් කරගත් හැටි, හීන කුමාරි එනකල්.
ඇත්තටම රොබීත් බලාගෙන හිටියා ටිවින්කිගෙ හීන කුමාරි එනකල්, ටිවින්කිට තිබුණු ආදරේට. කොයි තරම් බලාගෙන හිටියද ... කොයි තරම් ... පුංචි ටිවින්කිගෙ පුංචි හීනෙ හැබෑ වෙනකල් ... ඒත් අන්තිමට ඒ පුංචි හීනෙ හැබෑ වුණු හැටි ...
"හරි පුදුමයි !" මේ වෙච්ච දේවල් ඔක්කොම ඇත්තමද කියලා ටිවින්කිට අදහාගන්නත් බැරි තරම්.

හීන කුමාරි ! හීන කුමාරි ! හීන කුමාරි ! අනේ ඇයි මෙහෙම කළේ මට?
මම කොච්චර ආදරේද හීන කුමාරිට. ඇයි මට මෙහෙම කළේ.
අසරණ පුංචි බෝනික්කි ඉකිගහමින් ඇඬුවා. කෑගහමින් ඇඬුවා.
අඬලා අඬලා කම්මුල්වල යන්තමින් ඉතිරි වෙලා තිබුණු රෝස පාට ටිකත් දියවෙලා ගියා. ... දියවෙලා ගියදෙන් ඔක්කොම ... ඔක්කොම ... කමක් නෑ ...
රෝස පාට? මොකටද තවත්?
ඉස්සර රන්වන් පාට කොණ්ඩෙ දැන්, කුණු වෙච්ච එළවළු කෑලි එතිලා.
ලස්සන සේද ගවුමෙ, ගඳ ගහන කුණු පැල්ලම් වැටිලා.
පුංචි ටිවින්කි ඇඬුවා, ඇඬුවා, තවත් ඇඬුවා.
පුංචි බෝනික්කිට මේ වුණු දේ මදිවටදෝ, මහා වැස්සකුත් කඩාගෙන වැටුණා.
වැස්ස විතරක්ද, නෑ, තද සුළං හමමින් අකුණුත් ගැහුවා, රෑ කළුවරේ.
අනේ පුංචි අසරණී, ඇඬුවා, ඇඬුවා, කෑ ගහමින් ඇඬුවා.
ඉකි ගහමින් ඇඬුවා. ඇස් දෙකේ කඳුළු ඉවරවෙනකල් ඇඬුවා.
ඉවසන්න පුළුවන්ද පුංචි බෝනික්කියකට, මේ තරම්!
පාළු, කළුවර, බියංකර රෑක,
පුංචි බෝනික්කියක් කුණු කන්දක තනිවෙලා.
තෙමි තෙමී අඬනවා.
අසරණ පුංචි බෝනික්කි
ඇස් දෙක තද කරලා වහගත්තා.
තද කරලා, තද කරලා වහගත්තා.



පහුවදා උදේ වැස්ස පැච්චා. ටිවින්කි එහෙමම හිටියා. එයාට ඔළුව හරවන්නවත් හයියක් තිබුණෙ නෑ. හිතන්නවත්, පණ පොදක් තිබුණෙ නෑ, ඇස් දෙක අරින්නවත්. ඇස් දෙක නම් අරින්න ඕනෙම නෑ, ආයෙත් කවදාවත්ම, කවදාවත්ම. ඇස් දෙක ඇරලා මොනවා බලන්නද ? ඇස් දෙක රිදෙනකල් බලා හිටි හීන කුමාරි, අන්තිමට... තවත් මොනවා දකින්නද? පුංචි බෝනික්කි තව තවත් ඇස් දෙක තද කරලා වහගත්තා.

එතකොටම එයාට දැනුණා, මොකෙක්දෝ කුණු ගොඩ අවුස්සනවා වගේ.

"ඊයෙ වගේ බලු කුක්කෙක් වෙන්න ඇති." ටිවින්කි හිතුවා.

එයා ඇස් දෙක තද කරගෙන නොසෙල්වීම හිටියා.

"කමක් නෑ බලු කුක්කො, කන්න මාව. කන්න...ඉක්මනට...මට තවත් ඉන්න බෑ. මාව කන්න. ඉක්මනට..." ටිවින්කි තවත් ඇස් දෙක තද කරගත්තා.

ඒත්...ඒ බලු කුක්කෙක් නෙමෙයි...පූස් හාමියෙකුත් නෙමෙයි...

බටු මීයෙකුත් නෙමෙයි....... එහෙනම්?



ඒ එක්කම "බෝනික්කෙක් ! බෝනික්කෙක් !" කවුදෝ කෑගැහුවා.
ට්වින්කි ගැස්සුණා හොඳටෝම. ඇස් දෙක ඇරියා ලොකුවට.
කවුද මේ? පුංචි ගෑනු ළමයෙක් !
...රෝස කම්මුල් නම් නෑ, නිල් පාට ඇස් දෙකකුත් නෑ, රන්වන් කොණ්ඩයකුත් නෑ,
ගවුමත් තැනින් තැන ඉරිලා, කිළුටු වෙලා.
ඒත් ඒ පුංචි මූණේ, ඒ පුංචි ඇස් දෙකේ, ඒ පුංචි හිනාවෙ, තිබුණා මොකද්දෝ
අමුතු ලස්සනක්. ඒ හිනාවට ට්වින්කිගෙ හිත පිරිලා ඉතිරුණා, සතුටින්.
පුංචි ගෑනු ළමයා, එකපාරටම බෝනික්කා කුණු ගොඩෙන් ඇදලා අරගෙන,
පපුවට තුරුල් කරගත්තා.



"මට කවදාවත්ම ... ක-කවදාවත්ම ... ලැබිලා නෑ බෝනික්කෙක් !"
පුංචි පැංචිට සන්තෝසෙට වචනත් පැටළුණා.

එයා ගඳගහන බෝනික්කි අරගෙන තුරුල් කරගෙන ගෙදරට දිව්වා.
ගෙදරට...? නෑ...ඇත්තටම ඒ ගෙදරක් නම් නෙමෙයි...
බස් නැවතුම පිටිපස්සෙ තිබුණු පුංචි හෙවනක්.
ඒ හෙවනෙ අම්මා කෙනෙක් පුංචි මල්ලියෙක් නළවමින් හිටියා, ආදරෙන්.

...පුංචි පැංචි ඉක්මනට ටිවින්කිව ළඟ තිබුණු වතුර කරාමය ළඟට අරගෙන ගියා.
පුංචි ටිවින්කිට නාවලා, කොණ්ඩෙ සෝදලා, ඇඳුම සෝදලා, පිසදැම්මා.
...පරෙස්සමින් !



ර්ට පස්සෙ අව්වට අල්ලලා කොණ්ඩය, ගවුම, වේලුවා. ර්ට පස්සෙ උකුළෙ නළවමින් නිදි කළා. කොහෙන්දෝ හොයාගත් කැඩුණු පනාවකින් ට්වින්කිගෙ කොණ්ඩෙ පීරුවා...පුංචි බෝනික්කිට රිදෙයිදෝ පරෙස්සමින් ...ආදරෙන්...
පුංචි පැංචිට සතුට වැඩිකමට බෝනික්කිව අතින් බිම තිබ්බෙ නෑ.
චූටි අම්මෙක් වගේ පුංචි බෝනික්කිව නැළෙව්වා. තුරුල් කරගත්තා.
උකුළෙ තියලා පැද්දෙව්වා. නිදි කළා. පුංචි කිරිල්ලියක් වගේ නැළවිලි ගීත් කිව්වා.

ඇත්තටම මේ හීනයක්ද කියලා පුංචි ට්වින්කිට හිතාගන්නත් බැරි වුණා.





වැස්ස එනකොට පුංචි පැංචි ට්වින්කිව දෝතින්ම
තුරුල් කරගත්තා, එක වැහි පොදක්වත් නොවැටෙන්න.
අව්ව සැර වෙනකොට අරගෙන දිව්වා හෙවනකට.
මේ තරම් ආදරයක් ! මේ තරම්...ම ආදරයක් !!
වෙන කොයින්ද ?

ට්වින්කිට ඒ ආදරේ දරාගන්න බැරි තරම්. හීන කුමාරියෙක්
හොයාගෙන ගිහින් අතරමං වුණු පුංචි බෝනික්කිට,
අහිංසක හිඟන පැංචියෙකුගෙන් පිරිලා ඉතිරිලා යන ආදරයක් !
පුංචි පැංචිගේ ආදරේ වැඩිවෙනකොට,
පුංචි බෝනික්කිගෙ ඇස්වලින් කඳුළු ඉතිරුණා.

පුංචි බෝනික්කි කඳුළු අතරින් බලා හිටියා, පුංචි පැංචි දිහා.
"කොයි තරම් ලස්සනද මේ කම්මුල් - රෝස පාට නැතුවාට
කොයි තරම් ලස්සනද මේ ඇස් - නිල් පාට නැතුවාට
කොයි තරම් සනීපයිද මේ හෙවන - මාලිගාවක් නොවුණාට
කොයි තරම් අපූරුද මේ ආදරේ - පුංචි හීන කුමාරියකගෙන් නොවුණාට"
ට්වින්කිගෙ හිත මිම්ණුවා, හෙමිහිට.
...ඒ එක්කම පුංචි බෝනික්කිගෙ කම්මුල් දිගේ ගිහින්
පුංචි හිඟන පැංචිගෙ උකුළට වැටුණා
දිලිසෙන ලොකු කඳුළු කැට දෙකක්...
සතුටට...



